පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - උතුරු මැද පළාත
උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම -2016

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2016-10-20 දින වේ.

A. කාර්මික නිලධාරී (සිවිල්) - තාක්ෂණ සේවය III ශ්‍රේණිය
B. කාර්මික නිලධාරී (සිවිල්) - පුහුණු කිරීමේ ශ්‍රේණිය
C. සත්ව සංවර්ධන උපදේශක - තාක්ෂණ සේවයේ III ශ්‍රේණිය
D. ඉඩම් නිලධාරී - තාක්ෂණ සේවයේ III ශ්‍රේණිය

02. බඳවා ගැනීම් සිදුකරන අවස්ථාවේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

03. සුදුසුකම් :

3.1. පොදු සුදුසුකම්

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරු මනා ශාරීරික හා මානසික යෝග්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු අතර, මනා චරිතයකින් යුක්ත විය යුතුය.
III. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
IV. අයදුම්කරු උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශය තුළ අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් ස්ථිරවම පදිංචිව සිටි බව සනාථ කළ යුතුය.
V. පිට පළාත් අයදුම්කරුවන්ටද මේ සඳහා අයදුම්කළ හැකි අතර, සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්කරුවන් උතුරු මැද පළාත තුළ නොමැති වුවහොත් පමණක් පළාතේ අවුරුදු 05 ක් සේවය කිරීමට යටත්ව, බඳවා ගැනීමට සලකා බලනු ඇත.
VI. රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ස්ථිර කරන ලද අය ඉහත තනතුරු සඳහා අයදුම් කරන්නේ නම්, ඔවුන් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතු අතර, එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති සතුටුදායක සේවා කාලයක් සහිත අය විය යුතුය.

3.2.අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :

- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පහත සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

අනු අංකය	තනතුර	සියලුම තනතුරු සඳහා අ.පො.ස. (සා./පෙළ) සුදුසුකම්	තනතුර සඳහා අ.පො.ස. (උ./පෙළ) සුදුසුකම්	තාක්ෂණික සුදුසුකම්
01	තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය	භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයන් 06 කින් එකවර සමත්වීම.	ව්‍යවහාර ගණිතය / ශුද්ධ ගණිතය / සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව / ඉංජිනේරු තාක්ෂණවේදය සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහිතව අ.පො.ස. (උ/පෙළ) විද්‍යා / ගණිත / තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් විෂයන් 3 කින් එකවර සමත්වීම.	I. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) හෝ II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්) හෝ III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) හෝ IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) හෝ V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස් සාර්ථකව සම්පූර්ණ කිරීම. හෝ VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම. හෝ VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අංශින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.
2.1	තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක)	ඉහත පරිදි වේ.	ඉහත පරිදි වේ.	I. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම. (උදාහරණ : ජාතික තාක්ෂණික සහතිකය - සිවිල්) හෝ II. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම. හෝ III. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම. හෝ IV. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අංශින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.
2.11	තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක)	ඉහත පරිදි වේ.	ඉහත පරිදි වේ.	අදාළ නොවේ.
03	සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය	ඉහත පරිදි වේ.	කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණවේදය, ජෛව සම්පත් තාක්ෂණවේදය, කෘෂි තාක්ෂණවේදය යන විෂයන් ගෙන් විෂයන් දෙකක් ඇතුළුව විෂයන් 03 කින් එකවර සමත්වීම.	I. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෙවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. හෝ II. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතාවය (NVQ 6) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම. හෝ III. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අංශින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.
04	ඉඩම් නිලධාරී III ශ්‍රේණිය	ඉහත පරිදි වේ.	ඉහත පරිදි වේ.	ඉහත පරිදි වේ.

3.3.අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

04. වැටුප් ක්‍රමය :

A. තාක්ෂණ සේවයේ II ආ තනතුරුවලට හිමි මාසික වැටුප් පරිමාණය (2016-02-25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව) MN 3-2016 දරන වැටුප් ඛණ්ඩය යටතේ රුපියල් 31040-10x445-11x660-10x730-10x750- රු. 57550/- වේ. උක්ත චක්‍රලේඛයේ උපලේඛනයේ II අනුව වැටුප් ගෙවනු ඇත.

B. තාක්ෂණ සේවයේ පුහුණු කිරීමේ ශ්‍රේණි සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V වගුව II අනුව රු. 15924.00 මාසික දීමනාවක් ගෙවනු ඇත.

05. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් හා වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල පිළිබඳව 2016 අයවැය යෝජනා අනුව ඉදිරියේදී සකස්වන රාජ්‍ය ප්‍රතිපත්ති අනුව තීරණය කරනු ලැබේ. (පුහුණු කිරීමේ ශ්‍රේණියේ අය හැර).

06. බඳවා ගැනීමේ ක්‍රමය

6.1. විවෘත තරග විභාගය

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයක ප්‍රතිඵල මත කුසලතාවය අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් මෙම තනතුර සඳහා පත් කිරීමට තෝරා ගනු ලැබේ.

ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙළ අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගැනීම් කරනු ලැබේ. විභාගය සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි.

6.1.1 ලිඛිත විභාගය

1. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි - (ලකුණු 100 යි)

   මෙම විෂයය සඳහා සියලුම තනතුරු අපේක්ෂකයින් මුහුණදිය යුතු වේ. මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය - කාලය පැය 03 යි (ලකුණු 100 යි)

   තනතුරට අදාළව තාක්ෂණික දැනුම මැන බැලෙන පහත සඳහන් ඔසුවරණ හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විතවේ.

6.1.2 එක් එක් තනතුරු සඳහා නියමිත විෂයය නිර්දේශ :

- **කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියේ / පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා**

  කාර්මික නිලධාරියෙකුට තිබිය යුතු දැනුම පරීක්ෂා කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තු කටයුතු, මාර්ග තැනීම හා නඩත්තුව, ජල සම්පාදන හා ජලාපවාහන සම්බන්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. (සිවිල් තනතුර සඳහා අයදුම්කර ඇති අය පමණක් පෙනී සිටිය යුතුය.)

- **සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය.**

  අපේක්ෂකයින්ගේ තාක්ෂණික දැනුම මැන බැලෙන ප්‍රශ්න වලින් සමන්විත වේ.

- **ඉඩම් නිලධාරී III ශ්‍රේණිය.**

  අපේක්ෂකයින්ගේ තාක්ෂණික දැනුම මැන බැලීම සඳහා වූ ප්‍රශ්නවලින් සමන්විත වේ.

  ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය
  - a). දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය
  - b). රැකියා නියුක්තිය
  - c). කෘෂිකර්මාන්තයේ අපනයන ආනයන තත්ත්වය.

  II. ශ්‍රී ලංකා දේශගුණික කලාප පිළිබඳ දැනුම
  III. පස සහ ශාක පෝෂණය
  - a). පසේ ව්‍යුහය හා වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා භෝග වගාව කෙරෙහි එහි බලපෑම.
  - b). ශාක පෝෂණය, පාංශු ශාක පෝෂණ කළමනාකරණය.
  - c). පැළෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු.

  IV. පාංශු රසායනය, පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම
  V. වාරි මාර්ග ක්‍රම හා ජල කළමනාකරණය
  - a). විවිධ භෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය
  - b). ක්ෂුද්‍ර ජල කළමනාකරණ ක්‍රම.
  - c). ජල වහනය හා එහි වැදගත්කම.

  VI. ශ්‍රී ලංකාවේ මහ ගොවි ජනපද ව්‍යාපාර හා මහවැලි ව්‍යාපාරය පිළිබඳ දැනුම
  - a). ජනපද ව්‍යාපාර ඇති ස්ථාන
  - b). මහවැලි ව්‍යාපාරයට අයිතිවන ප්‍රදේශ

  VII. ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම.
  VIII. සිතියම් ආශ්‍රිත කරුණු පිළිබඳ දැනුම
  - a). අනිලමානය, ඩම්පිලෙවලය, තියෝඩලයිට්රය (වක්‍රෝන්මානය)
  - b). 1.50000, 10000 අඟලේ සිතියම් හා අවසාන ගම් පිඹුරු පිළිබඳ විස්තර

  IX. ශ්‍රී ලංකාවේ දැනට පවතින ඉඩම් නීති පිළිබඳ හා ඒ සම්බන්ධ දෙපාර්තමේන්තු චක්‍රලේඛ පිළිබඳ දැනුම. ඉඩම් වර්ග - රජයේ ඉඩම්, පුද්ගලික ඉඩම්, ප්‍රවේණි ඉඩම්.
  X. ඉඩම් සංවර්ධන හා බෙදීම පිළිබඳ දැනුම.
  - a). වර්තමානයේ ඉඩම් සංවර්ධනය හා බෙදීම සම්බන්ධ ජාතික වැඩසටහන් පිළිබඳ අවබෝධය.
    - i. ඉඩම් නොමැති පුද්ගලයන් හඳුනාගැනීම.
    - ii. ඉඩම් බෙදීම
    - iii. ඉඩම් කැබලි කිරීම

  XI. රජ සමයේ සිට මේ දක්වා ඉඩම්වල අයිතිය බැහැර කිරීමට යොදාගත් ලේඛන පිළිබඳ අවබෝධය.
  - a). සන්නස්, නින්දගම්, බදුකර, ස්වර්ණ භූමි, රත් භූමි, රත්තිම.

07. විභාගය පැවැත්වීමට යෝජිත නගරය : අනුරාධපුර

08. විභාගය පැවැත්වෙන මාධ්‍ය :

මෙම විභාගය සිංහල හා දෙමළ භාෂා මාධ්‍ය දෙකෙන්ම පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

09. අයදුම්කිරීමේ ක්‍රමය :

9.1 A4 (සෙ.මී.21X25) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන සකස් කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 5 තෙක් පළමු පිටුවට ද 6 සිට 9 තෙක් දෙවන පිටුවටද ඉතිරිය තුන්වන පිටුවටද වන ලෙස සකස් කර අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළයුතු වේ.

9.2 නියමිත ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන, අසම්පූර්ණ හා ඉහත අංක 03 අනුව සුදුසුකම් නොමැති, නියමිත දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් හා නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

9.3 ඉල්ලුම්පතෙහි ඡායා පිටපත් භාරගනු නොලැබේ. (ඉල්ලුම්පතේ ඡායා පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාගයට අදාළ වන ප්‍රවේශපත්‍ර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අයදුම්කරුවන් වෙත එවනු ලැබේ. විභාග ප්‍රවේශපත් එවීම තුළින් ඔබගේ සුදුසුකම් සනාථ කළ බව සැලකිල්ලට නොගත යුතුය.

9.4 **විභාග ගාස්තු** : උතුරු මැද පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පළාත් සභා ශීර්ෂයට බැර වන සේ රු. 600 ක මුදලක් ගෙවා ලබා ගන්නා ලද NC- 100 ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත තීරුවේ නොගැලවෙන ලෙස අලවා එවිය යුතුය. (ලදුපතේ පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) කිසිම හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු නොගෙවනු ලබන බවත් එම ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමට ඉඩ නොදෙන බවත් සැලකිල්ලට ගත යුතුය.

9.5 ඉල්ලුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු / දිවුරුම් කොමසාරිස් වරයෙකු / නීතිඥවරයෙකු / පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන 2016-01-01 දිනට රු. 24,340/- කට නොඅඩු මාසික වැටුපක් ලබන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබිය යුතුය.

9.6 රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

9.7 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2016-10-20 දිනට පෙර "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, උතුරු මැද පළාත, අනුරාධපුර**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්පත් යොමු කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ.......... තනතුරු සඳහා බඳවා ගැනීම - 2016**" ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය.

9.8 තැපැල් කිරීමේ දී අයදුම් පත්‍රයන් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

10. විභාගයට පෙනී සිටීම :

විභාගය පවත්වන දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ඇත. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍ර නොලැබුණු අපේක්ෂකයන් වෙතොත් ඒ බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් විමසිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ එන්සී 100 කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබා ගෙන පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත. විභාගයේදී අපේක්ෂකයන් සිය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. විභාගය පවත්වන දිනය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යථා කාලයේදී දැනුම් දෙනු ඇත. සියලුම අයදුම්කරුවන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටී.

තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයා යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට එම අයට සිදුවනු ඇත.

11. මෙම තනතුරු පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු වලින් කොටසක් හෝ සියල්ලම හෝ නොපිරවීමේ බලය මෙන්ම දැන්වීමෙන් අනාවරණය නොවන යම් කරුණක් වේ නම් ඒ පිළිබඳව තීරණ ගැනීමේ බලය ද උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. තවද මෙහි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

(ආර්.එම්. වන්නිනායක),
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2016-09-19